# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,572 — 1965 නොවැම්බර් 29 වැනි සඳුදා— 1965.11.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම්

**අළුත් ඡන්ද නීති**

### පොදු දැන ගැනීම පිණිස ය

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ ප්‍රතිපාදනයන්ට කර ඇති සමහර සංශෝධනවලට අදාල වූ උපුටනයන් මහජනයාගේ, දේශපාලන පක්ෂවල සහ අපේක්ෂකයන්ගේ දැන ගැනීම සඳහා මෙහි දක්වා ඇත.

ඊ. එෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කෙමසාරිස්.

මැතිවරණ කොමසාරිස් කාර්යාලය,
33, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7, 1965.11.25 දිය.

**යොමු කර ඇති විධිවිධාන**

### ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ

27අ. (1) මේ ආඥාවෙහි විධිවිධාන යටතේ හා ඒ අනුව, ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට දේශපාලන පක්ෂයකට හිමිකම් ලැබිය යුතුය.

(2) අපේක්ෂකයන් විසින් ගෙවිය යුතු ඇප මුදලට අදාලවූ, පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාවේ 29එ වන වගන්තියෙහි විධිවිධානවල කාර්යය සඳහා ඒ ආඥාව යටතේ, එවැනි ප්‍රාදේශීය ඡන්ද විමසීම්වලට අනන්තර පූර්වයෙන් පවත්වන ලද, පසුගිය පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගනු ලැබුවේ නම්, එසේ පිළිගනු ලැබුවේ නම්, පමණක් එම පක්ෂය ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්යය සඳහා ද පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ලැබිය යුතුය.

(3) (2) වන උප වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වීම තරණ කොට ගෙන ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට දේශපාලන පක්ෂයක් හිමිකම් ලබා ඇති විට, එවැනි ප්‍රාදේශීය ඡන්ද විමසීම්වලට අනන්තර පූර්වයෙන් වූ පසුගිය පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දී පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව යටතේ එම පක්ෂයේ අපේක්ෂකයන්ට වෙන් කර දෙනු ලැබූ අනුමත කළ ලකුණ, (2) වැනි උප වගන්තියේ බලතල ප්‍රකාර, හිමිකම් නතරවන දිනය වනතෙක් එම කාර්යය සඳහා එවැනි පක්ෂයකට වෙන් කර දෙනු ලැබූ අනුමත කළ ලකුණ වශයෙන් සැලකිය යුතුය.

### නිල ඡන්ද දැන්වීම් පත්

39අ. (1) ඡන්ද විමසීමේ තරඟයක් පැවැත්වෙන යම් කොට්ඨාශයක තේරීම්භාර නිලධාරියා විසින්, ඒ කොට්ඨාශයට මෙම උප වගන්තිය අදාල වන්නේ නම්, එම කොට්ඨාශයේ ඡන්ද ලැයිස්තුවේ නම දක්වෙන එක් එක් ඡන්දදායකයා වෙත, පහත සඳහන් කරුණු නිශ්චිතව සඳහන් කෙරෙන, නිල ඡන්ද දැන්වීම් පතක් යැවිය යුතුය:—

(අ) කොට්ඨාශයේ අංකය සහ නමක් ඇතොත් ඒ නම,

(ආ) ඡන්ද ලැයිස්තුවෙහි දක්වෙන පරිදි ඡන්දදායකයාගේ නම, ලිපිනය සහ අංකය,

(ඇ) ඡන්දදායකයාට වෙන් කොට දෙන ලද ඡන්දපොල, සහ

(ඈ) ඡන්දය දීමේ දිනය සහ වේලාවල්.

(2) මෙහි (1) වන උප වගන්තිය යටතේහි වූ නිල ඡන්ද දැන්වීම් පතක් යටත් පිරිසෙයින් ඡන්ද දිනයෙන් පස් දවසකට වත් පෙර, සාමාන්‍ය තැපෑලෙන් ඡන්දදායකයකු වෙත ලැබෙන සේ යැවිය යුතුය. එබඳු පත්‍රිකාවක් යොමු කරනු ලැබූ තැනැත්තා වෙත එය භාරදීම තැපැල් කාර්යාලයක් විසින් කළ නොහැකි වූ අවස්ථාවක, එය ඡන්ද විමසන දිනය වන තෙක් ඒ තැපැල් කාර්යාලයෙහි රඳවා තැබිය යුතු අතර එය ලැබිය යුතු තැනැත්තා විසින් ඉල්ලා සිටියහොත් ඔහුට එය භාර දිය යුතුය.

(3) (අ) බලයක් නොමැතිව යම්කිසි නිල ඡන්ද දැන්වීම් පතක් වෙනයම් තැනැත්තකුට සපයන්නා වූ, හෝ

(ආ) වෙනයම් අපේක්ෂකයකුට නිල ඡන්ද දැන්වීම් පතක් විකුණන්නා වූ හෝ විකිණීමට ඉදිරිපත් කරන්නා වූ හෝ වෙනයම් තැනැත්තකුගෙන් නිල ඡන්ද දැන්වීම් පතක් මිලයට ගැනීමට ඉදිරිපත් වන්නා වූ,

සෑම කෙනෙක් ම වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරිපිටදී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසුව වරදකරු වීමේ දී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

(3අ.) (අ) රජයේ සේවකයකු වශයෙන් තමාගේ රාජකාරිය කරන අතරතුරදී එබඳු රජයේ සේවකයකු විසින් හැර වෙනත් යම් තැනැත්තකු විසින්, වෙන යම් තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පතක් තමා ළඟ තබා ගත හොත්, හෝ

(ආ) නිසි බලය නොමැතිව, මෙම ආඥාපනත යටතේ යම්කිසි ඡන්ද විමසීමක දී නිල ඡන්ද දැන්වීම් පතක් හෝ නිල ඡන්ද දැන්වීම් පතක්සේ පාවිච්චි කෙරෙන බවට හැඟෙන හෝ එසේ පාවිච්චි කරනු ලැබිය හැකි යමක් මුද්‍රණය කරන්නා වූ,

සෑම කෙනෙක් ම වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින්, පසුව, වරදකරු වී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.


1671—ආර් 10579—26,750 (65.11)

